00016

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
**SNP8341/SNP8531**- විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.09 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. අධ්‍යාපනය යන සංකල්පය ඔබේ වචනවලින් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ පන්තිකාමරයක උගන්වන ගුරුවරුන්ගේ අධ්‍යාපනික දර්ශනය පිළිබඳ නිපුණතාවල වැදගත්කම් පහක් (05) සඳහන් කරන්න.

03. සමාජානුයෝජනයේ මූලික ගති ලක්ෂණ පහක් (05) ගවේශණය කරන්න.

04. සමාජානුයෝජනයේ වර්ග දෙක(02) නම් කර උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. මාරියා මොන්ටිසෝරිගේ අධ්‍යාපනික දර්ශනය තුළ මූලික ප්‍රතිපත්ති ගණනාවක් දැකිය හැකිය. එම මූලික ප්‍රතිපත්ති සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

06. "අධ්‍යාපනය, දරුවා නිදහස් හා ස්වාධීන පුද්ගලයෙක් බවට පත් කළ යුතුය." - මහත්මා ගාන්ධි

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනයට අනුකූලව ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න.

07. විශේෂ අධ්‍යාපනයේ පරිණාමය යටතේ ඒකීකරණ අවධිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා" සහ "විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය" අතර අන්තර් සබඳතා උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 x 08 = 40)

## <u>2 වන කොටස</u>

09. (i) ජීන් ජැක්ස් රූසෝ විසින් යෝජනා කරන ලද අධ්‍යාපන සැලැස්මේ අවස්ථා පහ (05) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) පන්තිකාමරයේ විවිධ අවශ්‍යතා සහිත සිසුන් සම්බන්ධ ජීන් ජැක්ස් රූසෝ විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික මූලධර්ම ගවේශණය කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ මූලධර්ම අන්තර්කරණ පන්තිකාමරයක් තුළ විවිධ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ක්‍රියාත්මක කළ හැකි ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) රාඹ් සහ පිරිස (2004) ඉදිරිපත් කරන ලද විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මූලධර්ම හත (07) නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ ඉහත සඳහන් කළ මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි අභියෝග උදාහරණ සහිත ව විමසා බලන්න. (ලකුණු 07)

(iii) ඉහත සඳහන් කළ අභියෝග ජය ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

11. (i) ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය භාවිතයේ සංවර්ධනය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) මහත්මා ගාන්ධි සහ කාල් මාක්ස් විසින් යෝජනා කරන ලද අධ්‍යාපන මූලධර්ම සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපන භාවිතයන් සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා මහත්මා ගාන්ධි සහ කාල්මාක්ස් යෝජනා කළ මූලධර්ම ශ්‍රී ලංකා සංදර්භය තුළ ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? ක්‍රියාමාර්ග හතරකින් (04) විස්තර කරන්න. (ලකුණු 08)

12.(i) 'පවුල' යන සංකල්පය ඔබේ වචනවලින් නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) දෙමාපියන් විසින් දරුවන් රැකබලා ගන්නා , දෙමාපිය වර්ග තුනක් (03) සහ එම ළමයින්ගේ චර්යා වර්ග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ දෙමාපියන් විසින් ඔවුන් රැකබලා ගැනීමේ ආකාරය හේතුකොටගෙන චිත්තවේගී හා චර්යාත්මක ගැටලු ඇති කරන ආකාරය සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත හා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා රහිත දරුවන්ගේ දරුවන්ගේ වැදගත් සමාජානුයෝජන කාරකයක් ලෙස සමපදස්ථ කණ්ඩායම් දැකිය හැකි ය."

ඉහත ප්‍රකාශය සුදුසු උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න. (ලකුණු 05)

(ii) සමාජානුයෝජන ක්‍රියාවලියේ දී විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත දරුවන් තම සමපදස්ථයන් සහ අන්තර්ක්‍රියා කිරීමේ දී මුහුණ දෙන අභියෝග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයකු ලෙස, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා නොමැති සිසුන් අතර අන්තර්ක්‍රියා වැඩි දියුණු කිරීමට ඔබට භාවිත කළ හැකි උපාය මාර්ග මොනවා ද? (ලකුණු 09)

14. (i) සමාජ සචලතාව යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් තම ජීවිතයේ ධනාත්මක සමාජ සචලතාව ඇතිකර ගැනීමේදී මුහුණ දෙන අභියෝග මොනවා ද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.(ලකුණු 07)

(iii) ශ්‍රී ලාංකීය සංදර්භය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ ධනාත්මක සමාජ සචලතාව සඳහා ජනමාධ්‍ය විසින් ඉටුකරන කාර්යභාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 07)

හිමිකම් ඇවිරිණි.

iii. As an inclusive class teacher, what are the strategies you can use to improve peer interaction between students with special educational needs and without special educational needs.

(09 marks)

14. i. What do you mean by social mobility of children with special educational needs?

(05 marks)

ii. Illustrate by citing example, what are the challenges faced by students with special educational needs in positive social mobility in their life? (07 marks)

iii. Explain with example the role plays by the mass media in positive social mobility of children with special education needs in Sri Lankan context. (08 marks)

*-Copyrights reserved-*